# තනතුරු - ඇබෑර්තු

## සංශෝධනයයි

### මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

"ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II පන්තියේ II ශ්‍රේණියට (අධිසේවක පදනම මත) පත් කිරීමට අයදුම්පත් කැඳවීම"

2008.08.29 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ 1 කොටස (11අ) ඡේදය යටතේ "ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය ක්‍රියාත්මකව පවත්නා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල ක්‍රමසම්පාදන කටයුතුවල නිරත නිලධාරීන් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට (අධිසේවක පදනම මත) පත්කිරීම සලකා බැලීම සඳහා අයදුම්පත් කැඳවීම" මැයෙන් පළකරන ලද නිවේදනයේ 02 ඡේදයේ (අ) සිට (ඊ) දක්වා සඳහන් අයදුම්කළ හැකි නිලධාරී කාණ්ඩ පිළිබඳ විස්තර පහත සඳහන් අයුරු සංශෝධනය කරනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්*.-2000.05.30 දිනට බලපැවැත්වෙන ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථාවේ "ඉ" පරිශිෂ්ඨයේ සඳහන් පහත සේවාවල නිලධාරීන්ට පමණක් ඉල්ලුම් කළ හැක.

(අ) සැලසුම් ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන්

(ආ) සංවර්ධන නිලධාරීන්

(ඇ) සංඛ්‍යාලේඛන සහකාරවරුන් (මුදල් හා ක්‍රමසම්පාදන විෂයය භාර අමාත්‍යාංශය)

(ඈ) ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන් (යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය)

(ඉ) ව්‍යාපෘති නිලධාරීන් (සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය)

(ඊ) සංවර්ධන සහකාර (සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය) (දැනට සංවර්ධන නිලධාරී)

ඉහත සංශෝධනය හැර *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් විධි විධාන නොවෙනස්ව පවතිනු ඇත. 2008.08.29 දිනැති *ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කළ අය නැවත අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන අතර, මෙම නව සංශෝධන යටතේ අයදුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබන්නන් ඔවුන්ගේ අයදුම්පත් කලින් *ගැසට්* නිවේදනයේ සඳහන් ආකෘතියට අනුව පිළියෙල කර 2009.02.20 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ බත්තරමුල්ල, පැලවත්ත, විභාග කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි කරන ලද තැපැල් මඟින් යැවිය යුතුය. ඉල්ලුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ක්‍රමසම්පාදන සේවයට (අධිසේවක පදනම මත) පත්කිරීමේ සීමිත තරඟ විභාගය" යන්න පැහැදිලිව ලිවිය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එස්. අබේසිංහ,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2009 ජනවාරි මස 12 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

01-742

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සංශෝධනයයි

### ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරඟ විභාගය - 2007

අංක 1581 සහ 2008.12.19 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියට බඳවා ගැනීම සඳහා වන 2007 සීමිත තරඟ විභාගයට අදාළ *ගැසට්* නිවේදනයේ 1 ඡේදය යටතේ සම්මුඛ පරීක්ෂණය ලෙස දක්වා ඇති ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු වේ :-

"*වාචික පරීක්ෂණය* : ලිඛිත විභාගයේ සියළුම ප්‍රශ්නපත්‍රවලට පෙනී සිටි සෑම ප්‍රශ්න පත්‍රයකටම 40%ක අවම ලකුණු ප්‍රමාණයක් ලබාගත්තා වූ ද, අයදුම්කරුවන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රමාණවත් බවට නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගත්තා වූ ද, අපේක්ෂකයන් සම්බන්ධයෙන් වාචික පරීක්ෂණය පැවැත්වෙන දිනය ලේකම් විසින් තීරණය කරනු ඇත".

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

01-777

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.